රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | Combined Services Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: 011- 2696211-13 Telephone
ෆැක්ස් / தொலைநகல்: 011- 2695279 Fax
ඊ- මේල් / மின்னஞ்சல்: info@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk Web Site

මගේ අංකය / எனது இல / My No: COM/Trans/V/වා.ස්.මා./2026
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.07.21

සියලු අමාත්‍යාංශ ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරු
ප්‍රාදේශිය ලේකම්වරු

**<u>ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**

අංක : 02/2025 දරන 2025.07.21 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛය මඟින් ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු නිවේදනය www.pubad.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒකාබද්ධ සේවයේ සියලු නිලධරයන් හට මාර්ගගත ක්‍රමයෙන්,

a. LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://10.250.1.112/misco වෙබ් ලිපිනය ඔස්සේ ද

b. වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://43.224.125.68/misco වෙබ් ලිපිනය ඔස්සේ ද

වාර්ෂික ස්ථාන මාරු අයදුම් කළ යුතුය.

03. එමෙන්ම ආයතන ප්‍රධානීන් විසින් යටත් නිලධරයන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ තම නිර්දේශය, ආයතන (Institute) පිවිසුම ඔස්සේ මාර්ගගත දත්ත පද්ධතියට පිවිස ලබා දිය යුතු බවද කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේද ඇතුළත්ව ඇති පරිදි ඒකාබද්ධ සේවයේ සියලුම නිලධරයන් විසින් තම සේවා විස්තර මාර්ගගත ක්‍රමය ඔස්සේ ඇතුළත් කළ යුතු අතර තම අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ කාර්යාලය යටතේ සේවයේ නියුතු නිලධරයන් විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ තම සේවා විස්තර නිවරදිව යාවත්කාලීන කර ඇත්ද යන්න තහවුරු කරගැනීමෙන් අනතුරුව ආයතන ප්‍රධානී විසින් නිලධරයාගේ ස්ථාන මාරු ඉල්ලීම නිර්දේශ කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි. එහිදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම මැනවි.

a. අංක 2412/08 දරන 2024.11.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව පිහිටුවා ඇති නව කැබිනට් අමාත්‍යාංශ MISCO පද්ධතියේ ආයතන ලැයිස්තුවට ඇතුළත් කර ඇත. ඒ අනුව කිසියම් අමාත්‍යාංශයකට අනුයුක්තව සේවය කරන නිලධරයෙකු තම වර්තමාන සේවා ස්ථානය ලෙස අදාළ නව කැබිනට් අමාත්‍යාංශය යාවත්කාලීන කළ යුතුය.

b. තවද නිලධරයෙකු විසින් කිසියම් අමාත්‍යාංශයක් වෙත ස්ථාන මාරු ඉල්ලුම් කරන්නේ නම්, නව කැබිනට් අමාත්‍යාංශ නාමය තෝරා දැක්විය යුතු අතර කිසියම් අමාත්‍යාංශයකට අයත් අංශයක් යටතේ සේවය කරනු ලබයි නම් අදාළ අංශය ඇතුළත් අමාත්‍යාංශ නාමය නිවැරදිව තෝරා දැක්විය යුතුය .

උදා : රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය (ස්වදේශ කටයුතු අංශය)

c. සංවර්ධන නිලධාරී සේවයේ නිලධරයෙකු කිසියම් අමාත්‍යාංශයක්/ දෙපාර්තමේන්තුවක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සේවය කරයි නම්, Ministry Attachment/ Department Attachment යටතේ අදාළ කාර්යාලය තෝරා දැක්විය යුතුය.

උදා : විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි සේවය කරයි නම්, අදාළ Ministry Attachment කාණ්ඩය යටතේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය - (විදේශ රැකියා අංශය) - ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලෙසත් තොරතුරු ඇතුළත් කළ යුතුය.

d. **ඉහත a හා b හි සඳහන් උපදෙස් අනුව නිවැරදි ලෙස තොරතුරු ඇතුළත් නොකිරීම හේතුවෙන් ස්ථාන මාරු චක්‍ර ක්‍රියාත්මක කිරීමේදී, නිලධාරීන් භෞතිකව අදාළ සේවා ස්ථානයන්හි සේවය නොකිරීම හේතුවෙන් අනෙක් නිලධාරීන් අගතියට පත්වන බැවින් නිවැරදි දත්ත ඇතුළත් කිරීම සෑම නිලධාරියෙකුගේම වගකීම බව අවධාරණය කරන අතර, අදාළ ආයතන ප්‍රධානීන් මේ සම්බන්ධයෙන් තම විශේෂ අවධානය ලබා දිය යුතු වේ.**

e. **නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය / අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ නිලධාරියා, ඔහුගේ/ ඇයගේ ආයතන ප්‍රධානී සහ එම ලැයිස්තු සකස් කළ හා හරි/ වැරදි බලන ලද නිලධරයන් සම්බන්ධයෙන් සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම, අනවධානය යන කරුණු හේතු කොටගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට සලකා බලනු ලැබේ.**

f. **ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවය කළ නිලධරයකු සාමාන්‍ය ස්ථාන මාරුවීම් හෝ වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ස්ථාන මාරු ලැබ, වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු කර ඇත්නම් පහත පරිදි කටයුතු කළ යුතුවේ.**

i. ආයතනයේ ගිණුම මඟින් (Institution Account)

වාර්ෂික ස්ථාන මාරුවීමක් නම් එය ලබා දී ඇත්තේ MISCO මෘදුකාංගය ඔස්සේ බැවින් ප්‍රධාන මෙනුවෙහි ඇති Transfer-----Entry----Releasement යන සබැඳිය ඔස්සේ ආයතනයෙන් පිටතට ස්ථාන මාරු කළ නිලධරයා සේවා ස්ථානයෙන් නිදහස් කිරීම කළ බව යාවත්කාලීන කළ යුතුය.

එමෙන්ම ස්ථාන මාරු කළ නිලධරයාගේ නව සේවා ස්ථානයෙන් Transfer-----Entry----Duty Assume සබැඳිය ඔස්සේ නිලධරයා නව සේවා ස්ථානයට වාර්තා කිරීම යාවත්කාලීන කළ යුතුය.

ii. නිලධරයාගේ ගිණුම මඟින් (User Account)

පෙර සේවා තොරතුරු මෙතෙක් යාවත්කාලීන නොකළ නිලධරයන් තම පෞද්ගලික MISCO ගිණුම ඔස්සේ පිවිස මෙනුවෙහි ඇති Personal-------Personal Information----Add New Employee----Employment Details හි Work Place හා Date of Duty assumed at Current Institute හි දත්ත යාවත්කාලීන කළ යුතුය.

තවද මෙනුවෙහි Service----History----Transfer History ඔස්සේ නිලධරයා විසින් තමන් ලද වාර්ෂික ස්ථාන මාරු හා සාමාන්‍ය ස්ථාන මාරු පිළිබඳ සේවා තොරතුරු යාවත්කාලීන කළ යුතු වේ.

g. කිසියම් අමාත්‍යාංශයක්/දෙපාර්තමේන්තුවක්/කාර්යාලයක් යටතේ ප්‍රාදේශීය හෝ උප කාර්යාලවල සේවය කරන නිලධාරීන් තම සේවා ස්ථානය ප්‍රධාන කාර්යාලය ලෙස ඇතුළත් කිරීම හේතුවෙන් ඔවුන්ට ලබා දෙන ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ගැටළු පැන නැගී ඇත. එබැවින් 2026 වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමේදී වර්තමාන සේවා ස්ථානයේ මෙන්ම ඉල්ලුම් කරන සේවා ස්ථානයේද ලිපිනය ඇතුළත් කිරීමට අවස්ථාව සලසා දී ඇත. එය හුදෙක්ම සේවා ස්ථානය තහවුරු කර ගැනීමේ

අරමුණින් දක්වා ඇති බැවින් සෑමවිටම නිවැරදිව තම සේවා ස්ථානය හා ඉල්ලුම් කරන සේවා ස්ථාන තෝරා ඇතුළත් කිරීමට නිලධරයන් දැනුවත් කළ යුතු වේ.

h. නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කිරීමේදී තම වර්තමාන සේවා ස්ථානය හා ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථාන, MISCO මෘදුකාංගයේ දක්වා ඇති ලැයිස්තු මඟින් තෝරා ගත යුතුය. එසේ නොකරන්නේ නම් ස්ථාන මාරු ඉල්ලීම මාර්ගගත පද්ධතිය මඟින් ඉදිරිපත් කළ නොහැකි වනු ඇත.


05. MISCO මාර්ගගත පද්ධතිය ඔස්සේ ඉදිරිපත් කරනු ලබන ස්ථාන මාරු ඉල්ලීම් පමණක් ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ සලකා බලනු ලබන අතර මාර්ගගත පද්ධතිය ඔස්සේ ඉදිරිපත් නොකොට, වෙනත් පාර්ශ්වයන් මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

06. එමෙන්ම **ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු නිවේදනය ප්‍රසිද්ධ කිරීමෙන් පසු එනම්, 2025.07.21 සිට 2025.12.31 දක්වා වූ කාලසීමාව තුළ දී සාමාන්‍ය හා සුහද ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව සලකා නොබලන බවද කාරුණිකව දන්වා සිටිමි.**

07. තවද 2026.06.30 දිනට හෝ ඊට පෙර ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවාකාලය වසර 05 සම්පූර්ණ කරන ඒකාබද්ධ සේවයේ සියළු නිලධරයන් 2026 වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කළ යුතු අතර ඔවුන්ගේ සාමාන්‍ය හෝ සුහද ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව ද සලකා නොබලන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

08. තවද ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග, අදාළ දිනයන්හි නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතු අතර නියමිත දින ඉක්මවා මෙතෙක් ක්‍රියාත්මක නොවූ 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝගද කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

09. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවය කරන සියලුම ඒකාබද්ධ සේවයේ නිලධරයන් දැනුවත් කරන්නේ නම් මැනවි.



එන්.යූ. නිශාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්


ඊ තැපැල් ලිපිනය dgcs.pubad@gmail.com
දුරකතන අංකය 0112694560
ෆැක්ස් අංකය 0112692254

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක : 02/2025

මගේ අංක : COM/Trans/V/වා.ස්.මා./2026
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

2025.07. 21

**ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026**

අංක 2310/29 හා 2022.12.14 දිනැති(අති විශේෂ) ගැසට් පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධානවලට ද මෙයට යා කර ඇති ඒකාබද්ධ සේවයේ ස්ථාන මාරු ප්‍රතිපත්තියටද ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

02. ඒකාබද්ධ සේවයට අයත් පහත සඳහන් සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු **2026.01.01** දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක විය යුතුය.

i. රජයේ භාෂා පරිවර්තක සේවය (I/විශේෂ පන්තිය)
ii. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (2/3 පන්ති)
iii. සංවර්ධන නිලධාරී සේවය (III/II/I ශ්‍රේණි)
iv. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය (III/II/I ශ්‍රේණි)
v. කළමනාකරණ සේවා නිලධාරී සේවය (III/II/I ශ්‍රේණි)
vi. ඒකාබද්ධ රියදුරු සේවය (III/II/I/විශේෂ ශ්‍රේණි)
vii. කාර්යාල සේවක සේවය (III/II/I/විශේෂ ශ්‍රේණි)

නිලධරයන්ට මෙන්ම රාජ්‍ය සේවාවටද ඇතිවන අපහසුතා මග හැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු පිළිබඳ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සැලකිලිමත් විය යුතුය. තව ද 2025 ජූලි මස 21 දිනයත්, 2025 දෙසැම්බර් මස 31 දිනයත් අතර කාලයේදී නිලධාරීන්ගේ ඉල්ලීම මත කරනු ලබන වාර්ෂික නොවන ස්ථාන මාරු සඳහා ඉල්ලුම්පත්‍ර භාර නොගත යුතුය.

03. ස්ථාන මාරු කමිටු

ස්ථාන මාරු කමිටු පහත සඳහන් ආකාරයට පිහිටුවීමට ක්‍රියා කළ යුතුය.

3.1 ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කමිටු

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කොමිෂන් සභා, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි විවිධ ආයතන අතර සිදුවන ඒකාබද්ධ සේවයට අයත් නිලධරයන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

3.1.1 ස්ථාන මාරු සඳහා ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඒ ඒ සේවාවන් සඳහා ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් ලැබී තිබේ නම් අදාළ සේවාව සඳහා වෙන වෙනම ස්ථාන මාරු කමිටු පිහිටුවිය යුතුය.

3.1.2 සෑම ස්ථාන මාරු කමිටුවක් විසින්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන් හි (කාණ්ඩ අංක 1) XVIII පරිච්ඡේදයට යටත්ව මෙම චක්‍රලේඛයේ 4 වගන්තියේ සඳහන් පොදු ප්‍රතිපත්තිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කළ යුතුය.

3.2. අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු

අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලුම් කරන නිලධරයන් සිටී නම් අදාළ ආයතන, අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු පිහිටුවා එම ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. මෙහි ඇමුණුම 03 හි සඳහන් අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු මා

වෙත වාර්තා වී ඇති අතර, අදාළ ස්ථාන මාරු හා අභියාචනා කමිටු සංයුතිය ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු කමිටු හා සමාලෝචන කමිටු වලට අනුරූපව සකසා ගත යුතුය.

අදාළ සියළු අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු සඳහා අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තියක් සකසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවසරය ලබා ගත යුතු අතර විධිමත් පරිදි අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්ති අනුමත කරගෙන නොමැති සියළු ආයතන ඒ සම්බන්ධයෙන් විධිමත් අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ.

3.2.1 අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු තීරණ

a. දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල පිහිටුවන ස්ථාන මාරු කමිටු, ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කමිටුවලින් පසුව පැවැත්විය යුතු අතර 2026 වර්ෂයේ අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු තීරණ 2025.12.31 දිනට පෙර නිකුත් කළ යුතුය.

b. ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කමිටුව මඟින් ස්ථාන මාරු ලබා දී ඇති නිලධරයන් හට නැවත අභ්‍යන්තර ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලබා නොදිය යුතුය.

04. ස්ථාන මාරු සඳහා නිලධරයන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ පොදු ප්‍රතිපත්ති

මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ දෙවන වගන්තියේ විධිවිධාන අදාළ වේ. සංවර්ධන නිලධාරී සේවය සඳහා අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කළ ද මෙතෙක් අන්තර්ග්‍රහණය නොකළ නිලධරයන්ටද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

05. ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කමිටු වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන

5.1 ඒකාබද්ධ සේවයේ සියලු නිලධරයන් හට මාර්ගගත ක්‍රමයෙන් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කළ හැක. ඒකාබද්ධ රියදුරු සේවයේ හා කාර්යාල සේවක සේවයේ නිලධරයන්ට මාර්ගගත ක්‍රමය ඔස්සේ පෞද්ගලිකව අයදුම් කිරීම අපහසු වේ නම් තම සේවා ස්ථානය මඟින් එය සිදු කළ හැක. ඒ සඳහා අදාළ පහසුකම් ලබාදීමට ආයතන ප්‍රධානී විසින් ක්‍රියා කළ යුතුය.

a. LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://10.250.1.112/misco වෙබ් ලිපිනය ඔස්සේ ස්ථාන මාරු අයදුම් කළ හැක.

b. වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://43.224.125.68/misco වෙබ් ලිපිනය ඔස්සේ ස්ථාන මාරු අයදුම් කළ හැක.

5.2 ඒකාබද්ධ සේවා අංශයේ පිහිටුවා ඇති ස්ථාන මාරු කමිටු වෙත පහත සඳහන් ලියකියවිලි **2025.08.11** දිනට පෙර ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්/ ආයතන ප්‍රධානීන් ක්‍රියා කළ යුතුය.

i. මාර්ගගත මෘදුකාංගය ඔස්සේ 2025.12.31 දිනට ලබා ගන්නා ලද ආයතනයක/සේවා ස්ථාන සමූහය තුළ පවත්නා කාර්යාලයක හෝ කාර්යාලවල/දිස්ත්‍රික්කයක වසර 05 ට වඩා සේවය කළ නිලධරයන්ගේ හා ස්ථාන මාරු අයදුම් කළ නිලධරයන්ගේ නාමලේඛනය (නිලධාරීන්ගේ තොරතුරු නිවැරදිව ඇතුළත් කළ විට නැවත ලේඛන සැකසීමේ අවශ්‍යතාවයක් පැන නොනඟින බැවින් සියළු නිලධාරීන්ගේ තොරතුරු MISCO පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කිරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතු වේ)

ii. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කාර්යාලයන්හි සේවා අවශ්‍යතාවය මත රඳවා ගැනීමට අවශ්‍ය නිලධරයන් සහ වෛද්‍ය සහතික මඟින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙළෙන, ස්ථාන මාරු නොකළ යුතු නිලධරයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා පෞද්ගලිකවම සනාථ කළ යුතු වේ. එවැනි කරුණු වසර 05 ට වඩා සේවය කළ නිලධරයන්ගේ ලේඛනයේ වුවද සඳහන් කළ හැක.

iii. ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස දක්වා ඇති සේවා ස්ථානයන්හි සේවා අවශ්‍යතාවය මත නිලධරයන් රඳවා ගැනීම සම්බන්ධයෙන් වන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

iv. වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමෙන් අනතුරුව ඉහත කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හේතුවෙන් ස්ථාන මාරු චක්‍රයේ අනෙකුත් නිලධරයන් අගතියට පත්වන බැවින්, එවැනි ඉල්ලීම් සලකා බැලීමේ හැකියාවක් නොමැත.

5.3 ස්ථාන මාරු අයදුම්පත්‍ර

5.3.1 මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කරන ලද ඒකාබද්ධ සේවා නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම්පත් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීගේ නිර්දේශද මාර්ගගතව ලබාදිය යුතුය.

5.3.2 තවද එක් නිලධරයෙකුට මාර්ගගත ක්‍රමය ඔස්සේ එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දිය යුතුය.

5.3.3 ස්ථාන මාරුවීම් අයදුම් කරන නිලධරයන් කිසියම් ප්‍රදේශයක නිශ්චිත කාර්යාලයකට පමණක්ම ස්ථාන මාරු වී යාමට අපේක්ෂා කරන්නේ, එම ප්‍රදේශයට යාමේ අවශ්‍යතාවය මතද, නැතහොත් තමන් කැමති දෙපාර්තමේන්තුවකට හෝ කාර්යාලයකට යාමට ඇති අවශ්‍යතාව මතද, යන්න අයදුම්පතේ සඳහන් කිරීම සුදුසුය. ඒ අනුව තමන්ගේ මනාපය අනුපිළිවෙලින් දැක්වෙන පරිදි ප්‍රදේශ හෝ කාර්යාල නම් කළ යුතු වේ.

5.3.4 තවද,

i. යම් ආයතනයක් යටතේ ප්‍රාදේශීය කාර්යාලයන් වෙත යාමට බලාපොරොත්තුවෙන් ස්ථාන මාරු අයදුම් කරයි නම් අදාළ <u>උප / ප්‍රාදේශීය කාර්යාල නිවැරදිව දැක්විය යුතු වේ</u>. එසේ සඳහන් නොකොට, ප්‍රධාන කාර්යාලය පමණක් ඉල්ලා ස්ථාන මාරු ලබා දුන් පසු, තමන් අයදුම් කරන ලද්දේ එම ආයතනය යටතේ ප්‍රාදේශිය කාර්යාලයක් වන බැවින් ස්ථාන මාරු සංශෝධනය කරන ලෙස සිදුකරන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බැලීමේ හැකියාවක් නොමැත.

ii. නිලධරයන් විසින් තම සේවා ස්ථානය ලෙස සඳහන් කළ යුත්තේ තමා වර්තමානයේ සේවය කරන ස්ථානය වන අතර, නිර්දේශ ලබා දිය යුත්තේද අදාළ ආයතන ප්‍රධානියා වේ. මෙලෙසම <u>උප කාර්යාල වල සිටින නිලධරයන් තම සේවා ස්ථානය ලෙස දැක්විය යුත්තේ අදාළ උප කාර්යාලය වේ.</u>

සැ.යු. :

a. සංවර්ධන නිලධාරී සේවය හැර ඒකාබද්ධ සේවයේ අනෙක් සියලු නිලධාරීන් උප / ප්‍රාදේශීය කාර්යාලයන්හි සේවය කරයි නම් Sub Department යටතේ තමා සේවය කරන කාර්යාලය තෝරා ගත යුතු වේ. (උදා-කම්කරු දෙපාර්තමේන්තුවේ මාතර කාර්යාලයේ සේවය කරයි නම් Sub Department----Matara Labour Office ලෙස දැක්විය යුතු වේ. ආයතන ප්‍රධානියා කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව විය යුතුය).

b. ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගෙන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරනුයේ සංවර්ධන නිලධාරීන් පමණක් වන බැවින්, එසේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සංවර්ධන නිලධාරීන් පමණක් Department Attachment හා Ministry Attachment ඔස්සේ තම සේවා ස්ථානය සටහන් කළ යුතු වේ. (උදා- කිසියම් සංවර්ධන නිලධරයෙකු සේවය කරනුයේ බෞද්ධ කටයුතු දෙපාර්මේන්තුව යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම් සේවා ස්ථානය ලෙස දැක්විය යුත්තේ Department Attachment----Department of Buddhist Affairs-Attanagalla ලෙස වේ. ආයතන ප්‍රධානියා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විය යුතුය)

c. අනෙකුත් කිසිදු සේවාවක නිලධරයෙකු Department Attachment හා Ministry Attachment යන්න භාවිත නොකළ යුතුය. ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබා දීමේදී ද අදාළ අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සමග පමණක් ස්ථාන මාරු අයදුම්පත යොමු කළ යුතු වේ.

iii. <u>නිවැරදි ලෙස තොරතුරු ඇතුළත් නොකිරීම හේතුවෙන් ස්ථාන මාරු චක්‍ර ක්‍රියාත්මක කිරීමේදී, නිලධාරීන් භෞතිකව අදාළ සේවා ස්ථානයන්හි සේවය නොකිරීම හේතුවෙන් අනෙක් නිලධාරීන් අගතියට පත්වන</u>

බැවින් නිවැරදි දත්ත ඇතුළත් කිරීම සෑම නිලධාරියෙකුගේම වගකීම බව අවධාරණය කරන අතර, අදාළ ආයතන ප්‍රධානීන් මේ සම්බන්ධයෙන් තම විශේෂ අවධානය ලබා දිය යුතු වේ.

06. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු

6.1 ස්ථාන මාරු යෝජනාවන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සළකා බැලීම සඳහා කාර්ය පටිපාටික රීතීන්හි 254 වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවා ඒ අනුව අවශ්‍ය කටයුතු කළ යුතුය. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සළකා බලනු ලබන්නේ කාර්ය පටිපාටික රීතීන්හි 254 (iii) වගන්තියට අනුකූල වේ නම් පමණි.

6.2

a.) වාර්ෂික ස්ථාන මාරු චක්‍රවල සිටින අනෙකුත් නිලධරයන් අගතියට පත්වන බැවින්, නිලධරයෙකුගේ ඉල්ලීමක් අනුව ලබා දෙන වාර්ෂික ස්ථාන මාරුවීමක් අවලංගු කිරීමට හෝ කල් දැමීමට පසුව අභියාචනා කිරීම, හෝ ඒ සඳහා සේවා අවශ්‍යතාවය හේතුවක් ලෙස යොදා ගැනීම ආදිය නිර්දේශ කිරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු නොකළ යුතු අතර කිසියම් සාධාරණ හේතුවක් ඇත්නම් අදාළ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් නිර්දේශ කිරීමේදී ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු වේ.

b.) ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර තීරණ ගනු ඇත.

i. ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්.

ii. නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවුනු අවස්ථා. ("නිලධරයන්ගේ ඉල්ලීම්" යනු නිලධරයා විසින් ස්ථාන මාරුවීමට පළමුවන, දෙවන හා තෙවන මනාප ලෙස සඳහන්කර ඇති සේවා ස්ථාන වේ. )

iii. නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්. (ප්‍රියමනාප සේවා ස්ථානයන්හි වසර 05 ක සේවා කාලය අවසන් කර අනිවාර්ය ස්ථාන මාරු ලැබූ නිලධාරීන් විසින් ස්ථිර පදිංචියට ආසන්න ස්ථාන හෝ පදිංචිය වෙනස්වීම මත සිදු කරන ඉල්ලීම් සම්බන්ධයෙන් මෙය අදාළ නොවේ)

iv. ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධරයන්ට සිදුවූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම්.

6.3 වාර්ෂික ස්ථාන මාරු යෝජනා පිළිබඳ සමාලෝචන කමිටු තීරණ නිකුත් කළ පසු ඉදිරිපත් කරනු ලබන අභියාචනා කාර්ය පටිපාටික රීතීන්හි XVIII වන පරිච්ඡේදයේ 256 වගන්තිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. සමාලෝචන කමිටුවට ඉදිරිපත් නොවූ අභියාචනා පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සලකා නොබලනු ඇත.

6.4 අභ්‍යාන්තර ස්ථාන මාරු කමිටු මගින් ලබා දෙන තීරණ සම්බන්ධයෙන් අගතියට පත් වූ නිලධාරීන්ට අභ්‍යාන්තර ස්ථාන මාරු සමාලෝචන කමිටු පැවැත්වීමෙන් පසුව අදාළ තීරණ සම්බන්ධයෙන්ද සෑහීමට පත් නොවේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා යොමු කළ හැක.

07. ස්ථාන මාරු කාල සටහන

ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කමිටු කාල සටහන

| | |
|---|---|
| ජූනි 16ට පෙර | ස්ථාන මාරු කමිටු පිහිටුවීම |
| ජූලි 15ට පෙර | ස්ථාන මාරු පටිපාටිය සකස් කර ගැනීම |
| ජූලි 31ට පෙර | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම |
| අගෝස්තු 22 ට පෙර | පහත සඳහන් ලේඛන මාර්ගගතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම.<br>(i) LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://10.250.1.112/misco වෙබ් ලිපිනයෙන්ද වෙනත් ජාලයන් ඔස්සේ |

| | |
|---|---|
| | අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://43.224.125.68/misco ඔස්සේද මාර්ගගත ක්‍රමයට අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ කරන මාර්ගගත අයදුම්පත (online application)<br><br>(ii) මාර්ගගත මෘදුකාංගය ඔස්සේ ලබා ගන්නා ලද 2025.12.31 දිනට ආයතනයක/සේවා ස්ථාන සමූහය තුළ පවත්නා කාර්යාලයක හෝ කාර්යාලවල/දිස්ත්‍රික්කයක වසර 05 ට වඩා සේවය කළ නිලධරයන්ගේ හා ස්ථාන මාරු අයදුම් කළ නිලධාරීන්ගේ නාමලේඛනයක් |
| සැප්තැම්බර් 15ට පෙර | ඒකාබද්ධ සේවා අංශයේ මාරු කමිටු රැස්වී ස්ථාන මාරු තීරණ ගැනීම අවසන් කිරීම |
| ඔක්තෝබර් 01ට පෙර | ස්ථාන මාරු තීරණ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට දැන්වීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම |
| ඔක්තෝබර් 15ට පෙර | ස්ථාන මාරු වීම් පිළිබඳව ඒකාබද්ධ සේවා අංශය වෙත සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය |
| ඔක්තෝබර් 31ට පෙර | එම අභියාචනා පිළිබඳ සමාලෝචන කමිටු මගින් තීරණ ගැනීම |
| නොවැම්බර් 17ට පෙර | සමාලෝචන කමිටු තීරණ දැනුම් දීම අවසන් කිරීම |
| දෙසැම්බර් 01ට පෙර | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අවසන් දිනය |
| ජනවාරි 01 | වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම |

08. වාර්ෂික ස්ථාන මාරු පසුවිපරම් කමිටු

වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව 2026.02.15 දිනෙන් පසු පසුවිපරම් කමිටුවක් පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ.

09. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම

9.1

a. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/APL/1/AT/2018 හා 2019.05.11 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන විශේෂ පුහුණු ලබා ඇති කිසියම් නිලධරයෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම දෙපාර්තමේන්තුව තුළ රඳවා ගත යුතු යැයි දෙපාර්තමේන්තු ප්‍රධානියා අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිලිකර අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ඇතිව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත තම ඉල්ලීම් ඉදිරිපත් කළයුතුය.

b. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර නොමැති, වර්තමාන සේවා ස්ථානයේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් වසර 5 ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ විස්තර යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිලි කර අදාල අමාත්‍යාංශ ලේකම්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත තම ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය. එක් වතාවක් මෙම අවස්ථාව ලබා දී ඇති නිලධරයෙකු සඳහා නැවත කිසිදු අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

c. තවද ප්‍රියමනාප සේවා ස්ථාන ඉහත 9.1.a සඳහන් අනුග්‍රහය අදාළ නොවන අතර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මාරු කමිටුවලට ඒ පිළිබඳව දැනුම් දී ක්‍රියා කරනු ඇත. එක් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට සීමිත නිලධරයන් පිරිසක් සඳහා පමණක් ඉල්ලුම් කල හැක.

9.2 සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය / අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ නිලධාරියා, ඔහුගේ/ ඇයගේ ආයතන ප්‍රධානී සහ එම ලැයිස්තු සකස් කළ හා හරි/ වැරදි බලන ලද නිලධරයන් සඳහා සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම, අනවධානය යන කරුණු හේතු කොටගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට සලකා බලනු ලැබේ.

9.3 වාර්ෂික ස්ථාන මාරු නියෝග මගින් අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී

භාරගැනීමට හැකිවන පරිදි ඔවුන් මුදාහැරීමට කටයුතු කළ යුතුය. මෙම විධිවිධානවලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ.

9.4 ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවන්නේ නම්, ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක වීමට නියමිත දිනට පසු මාසයේ සිට අදාල නිලධාරීන්ගේ වැටුප නතර කිරීමට නිලධාරියා දැනට සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා විසින් පියවර ගත යුතුය.

9.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/1/AT/2024 දරන 2025.05.14 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති පරිදි ක්‍රියාත්මක නොවී පවත්නා වාර්ෂික ස්ථාන මාරු නියෝගයන්ට අදාළ නිලධරයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 අනුව කටයුතු කළ යුතුය. තවද එමඟින් අවධාරණය කර ඇති පහත සඳහන් කරුණු උපුටා දක්වන අතර, ඒ සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කළ යුතුය.
**"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(3) ව්‍යවස්ථාවට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව රජයේ නිලධාරීන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය සහ ඔවුන්ව සේවයෙන් පහ කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති අතර එම බලතල ප්‍රකාරව ගෙන ඇති තීරණයක් ක්‍රියාත්මක නොකර සිටීමේ හෝ සංශෝධනය කිරීමේ බලතල වෙනත් ආයතන ප්‍රධානීන් සතුව නොමැති බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සිහිපත් කරනු කැමැත්තෙමි. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක නොකරන හෝ සංශෝධනය කරන ආයතන ප්‍රධානීන් එවැනි තීරණවල වගකීම පෞද්ගලිකව දැරිය යුතු බවට ඔවුන් දැනුවත් කරන ලෙසද කොමිෂන් සභාව විසින් නියෝග කරන ලදී."**

9.6 ස්ථාන මාරුවීම් ලැබේ යයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරි කටයුතු කල් ඇතිව වෙනත් නිලධරයන් පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට අමාත්‍යාංශ ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

9.7

a. මාර්ගගත තොරතුරු තාක්ෂණ යෙදවුම් භාවිතා කරමින් කටයුතු කරන පහත සඳහන් ආයතන වල පමණක් ඒකාබද්ධ සේවයේ නිලධාරීන් යොදවනු ලබන කිසියම් තනතුරක් සඳහා විශේෂිත වෘත්තීය සුදුසුකමක් හෝ නිපුණතාවයක් (උදා- තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂ නිපුණතා, තාක්ෂණික නිපුණතා ආදිය) අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පූර්ව දැනුම් දීමක් සිදු කිරීමට ආයතන ප්‍රධානියා විසින් පියවර ගත යුතුය.

- විදේශ කටයුතු අමාත්‍යාංශය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

එසේවුවද ප්‍රියමනාප සේවා ස්ථානවල අනිවාර්ය සේවා කාලය අවසන් කර ස්ථාන මාරු ලබා දීමේදී නිලධරයන් රඳවා තබා ගැනීම සඳහා කිසි ලෙසකින්වත් යොදා නොගැනීම සඳහා ආයතන ප්‍රධානීන් වග බලාගතයුතු වේ.

b. එවැනි විශේෂ නිපුණතාවක් තිබිය යුතු අවස්ථාවක, ඉහත ආයතනයක ප්‍රමාණවත් පුහුණුවක් ලබා දුන් පසුවද ස්ථාන මාරු ලැබ පැමිණි නිලධරයාට රාජකාරි ඉටු කිරීමට අපහසුතාවක් ඇති බව නිරීක්ෂණය වේ නම් ඒ සඳහා සාධාරණ හේතු දක්වා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු වේ. එවිට අදාළ නිලධාරියා එම ආයතනයෙන් පිටතට ස්ථාන මාරු කිරීමට කටයුතු කරන අතර එම ආයතනය වෙත වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර ඇති, අදාළ තනතුර සඳහා සුදුසුකම් ඇති වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ ඉන්පසු සිටින නිලධාරියා ඒ සඳහා අනුයුක්ත කරනු ලැබේ. එවිට පිටතට ස්ථාන මාරු කරනු ලැබූ නිලධාරියා සුදුසුකම් සහිත අනෙක් නිලධාරියාගේ සේවා ස්ථානය වෙත ස්ථාන මාරු කරනු ලැබේ. එමෙන්ම නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබා දීමේදී සේවයේ අවශ්‍යතාවය සලකා කටයුතු කරන බැවින්, එවැනි නිලධරයන් පිටතට ස්ථාන මාරු කිරීමේදී ඔවුන් ස්ථානගත කිරීම හුදෙක්ම වාර්ෂික ස්ථාන මාරු අයදුම් ලේඛනය අනුව පමණක් සිදු කරනු ලැබේ.

9.8 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-6/03/LEA/3165(3) හා 2024.06.11 දිනැති ලිපියේ උපදෙස් පරිදි 2026 වාර්ෂික ස්ථාන මාරු තීරණ ලබාදී ඇති කිසිදු නිලධරයෙකුට වර්තමාන සේවා ස්ථානයේදී 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන යටතේ නිවාඩු අනුමත නොකළ යුතුය.


9.9 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතීන්හි 257 වගන්තියේ සඳහන් විධිවිධාන බල පැවැත්වෙනු ඇත.

10. නිලධාරීන්ගේ වගකීම්

වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයන්ගේ වගකීමක් වන අතර ඒ සඳහා සියලුම නිලධරයෝ නියමිත දිනයේදී නව රාජකාරී ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටිති.

11. මෙම චක්‍රලේඛයේ දක්වා නොමැති විධිවිධාන සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

12. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01) හි XVIII පරිච්ඡේදයේ 251 වගන්තිය අනුව නිකුත් කරනු ලැබේ.



එන්.යූ. නිෂාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## <u>ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය</u>

1.හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 2310/29 හා 2022.12.14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධානවලට අනුව ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

2.වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර

2.1 අදාළ නිලධරයන්

ඒකාබද්ධ සේවයට අයත් පහත සඳහන් සේවාවන්හි නිලධරයන් සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාල වේ.

i. රජයේ භාෂා පරිවර්තක සේවය (I/විශේෂ පන්තිය)
ii. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (2/3 පන්ති)
iii. සංවර්ධන නිලධාරී සේවය (III/II/I ශ්‍රේණි)
iv. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය (III/II/I ශ්‍රේණි)
v. කළමනාකරණ සේවා නිලධාරී සේවය (III/II/I ශ්‍රේණි)
vi. ඒකාබද්ධ රියදුරු සේවය (III/II/I/විශේෂ ශ්‍රේණි)
vii. කාර්යාල සේවක සේවය (III/II/I/විශේෂ ශ්‍රේණි)

2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කල යුතු සේවා කාලය

2.2.1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2 එකම සේවා ස්ථානයක හෝ ඇමුණුම 01 හි දක්වා ඇති සේවා ස්ථානයක හෝ සේවා ස්ථාන කිහිපයක් තුළ වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරු වීම් වලට යටත් වේ. (එකම දිස්ත්‍රික්කයක් තුළ සේවා ස්ථාන සමූහ එකකට වැඩි ගණනක් පැවතිය හැක)

2.2.3 ප්‍රියමනාප සේවා ස්ථාන වල වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

2.3 සේවා ස්ථාන වර්ගීකරණය

2.3.1 ප්‍රියමනාප සේවා ස්ථාන

ස්ථාන මාරුවී යාමට ඉල්ලීම් වැඩි ප්‍රමාණයක් එවා ඇති සේවා ස්ථාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ 251 වගන්තියෙහි (iii) උප වගන්තිය යටතේ දක්වා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් පහත සේවා ස්ථාන ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස හැඳින්වෙන අතර ස්ථාන මාරුවී යාමට අඩු ඉල්ලීම් ප්‍රමාණයක් ඇති සේවා ස්ථාන ප්‍රියමනාප නොවන සේවා ස්ථාන වශයෙන් හැඳින්වේ.

පහත සඳහන් සේවා ස්ථාන ප්‍රියමනාප සේවා ස්ථාන වේ. මෙම සේවා ස්ථාන ඉහත නිර්ණායකයන් අනුව වාර්ෂිකව වෙනස් විය හැක.

| ආයතනය | ආයතනය ප්‍රියමනාප සේවා ස්ථානයක් වන සේවාවන් |
|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවයේ සියළු සේවාවන්හි නිලධාරීන් සඳහා |
| රේගු දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවයේ සියළු සේවාවන්හි නිලධාරීන් සඳහා |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවයේ සියළු සේවාවන්හි නිලධාරීන් සඳහා |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවයේ සියළු සේවාවන්හි නිලධාරීන් සඳහා |
| රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවයේ සියළු සේවාවන්හි නිලධාරීන් සඳහා |
| සුරාබදු දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවයේ සියළු සේවාවන්හි නිලධාරීන් සඳහා |
| විදේශ කටයුතු අමාත්‍යාංශය | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය,ඒකාබද්ධ රියදුරු සේවය,කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිලධාරීන් සඳහා |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවයේ සියළු සේවාවන්හි නිලධාරීන් සඳහා |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය හා ඒකාබද්ධ රියදුරු සේවය යන සේවාවන්හි නිලධාරීන් සඳහා |

2.3.2 ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවය කරන/නව ස්ථාන මාරු වීම් ලද නිලධාරීන් සඳහා පහත කරුණු බලපැවැත්වෙනු ඇත.

i. සංවර්ධන නිලධාරී සේවය හැර අනෙකුත් ඒකාබද්ධ සේවාවල නිලධාරීන්හට මුදල් අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රියමනාප සේවා ස්ථානයක් වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2026 වාර්ෂික ස්ථාන මාරුවීම යටතේ සෘජුව ස්ථාන මාරු ලබාදෙනු ලැබේ. සංවර්ධන නිලධාරීන්හට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සෘජුවම ස්ථාන මාරු ලබා නොදෙන අතර, මුදල් අමාත්‍යාංශය වෙත පමණක් ස්ථාන මාරුවීම් ලබා දීම සිදු කරනු ලැබේ. අදාළ අනුයුක්ත කිරීම් මුදල් අමාත්‍යාංශය මඟින් සිදු කරනු ඇත.

ii. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ සහ කාර්යාල සේවක සේවයේ නිලධරයන්ට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වෙත සෘජුව ස්ථාන මාරු ලබාදෙනු ලැබේ. එලෙස ස්ථාන මාරු ලබාදීමේ දී කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයන්ට තොරතුරු තාක්ෂණය පිළිබඳ නිපුණතාවයන් හා වෙනත් තාක්ෂණික නිපුණතා පිළිබඳව සලකා කටයුතු කරනු ලැබේ.

iii. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත සෘජුවම නිලධාරීන්හට ස්ථාන මාරු ලබා නොදෙන අතර, මුදල් අමාත්‍යාංශය වෙත පමණක් ස්ථාන මාරු ලබා දීම සිදු කරනු ලැබේ. අදාළ අනුයුක්ත කිරීම් මුදල් අමාත්‍යාංශය මඟින් සිදු කරනු ඇත.

iv. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිර්දේශ පරිදි එම දෙපාර්තමේන්තුවේ සේවා කාලය වසර 05ක් සම්පූර්ණ කරන ඒකාබද්ධ සේවයේ සියලු නිලධරයන්, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ (කොළඹ) සේවය කරන බව සලකා වාර්ෂික ස්ථාන මාරුවීම් ලබා දෙනු ලැබේ.

v. අ. ඉහත 2.3.1වගන්තිය අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව තුළ 2026.06.30 දිනට වසර 5 සම්පූර්ණ කළ ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් අනිවාර්ය ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

ආ. 2.3.1 වගන්තිය මගින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස නම් කර ඇති බැවින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට පෙර, ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කර ඇති නිලධාරීන්, එම ප්‍රියමනාප සේවා ස්ථානයේ සේවය කිරීමෙන් අනතුරුව වසර 15 ඉක්මවීමට පෙර රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවී පැමිණ ඇත්නම් එම සියළු නිලධාරීන්ද මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

ඇ. ඉහත අ සහ ආ යටතේ සඳහන් විධිවිධාන අනුව අදාළ අවශ්‍යතාවයන් සපුරා ඇති රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් අනිවාර්යයෙන් වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම්පත් යොමු කළ යුතුය. එලෙස ඉල්ලුම්පත් යොමු නොකරන ලද නිලධාරියෙකු ඕනෑම

සේවා ස්ථානයකට ස්ථාන මාරුවීම සඳහා මනාපය පළ කරනු ලැබූ නිලධාරියෙකු සේ සලකා කටයුතු කරනු ලැබේ.

vi. 2026 වර්ෂයේ සිට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් සඳහා ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස නොසැලකේ. ඒ අනුව,

a. 2025.12.31 දිනට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වසර 05ක සේවා කාලය සම්පූර්ණ කරන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ සියලුම නිලධාරීන් 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ පිටතට ස්ථාන මාරු කරනු ලැබේ.

b. එසේ පිටතට ස්ථාන මාරු ලබන නිලධාරියෙකු විසින් නැවත ප්‍රියමනාප සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරුවීමට කරනු ලබන ඉල්ලීමක් එම නිලධාරියා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පිටතට පැමිණි දිනට වසර 02 කට පසුව සලකා බලනු ලැබේ.

vii. ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කළ නිලධාරීන් විසින්, ප්‍රියමනාප ලෙස වර්ගීකරණය නොකළ මූලා හෝ වෙනත් ප්‍රතිලාභ සහිත සේවා ස්ථාන හෝ නිවසට ආසන්න සේවා ස්ථාන ඉල්ලා සිටීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වන බැවින්, එවැනි ඉල්ලීම් සලකා බලනුයේ තම සේවා කාලය තුළ කිසිදු ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය නොකළ නිලධාරීන්ගේ සියළු ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව පමණක් වේ.

viii. ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරන නිලධරයෙකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයකට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරයි නම්,එම නිලධරයන් අනිවාර්ය සේවා කාලය අවසන් කර ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් එම ප්‍රියමනාප සේවා ස්ථානයට ආසන්නම කාර්යාලයකට හෝ නිලධරයාගේ ඉල්ලීමකට අදාළ ප්‍රියමනාප නොවන කාර්යාලයකට (ප්‍රියමනාප සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති) මාරු කළ යුතුය. (වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කරනු නොලැබූ ඉල්ලීම් සම්බන්ධයෙන් පසුව සළකා බලනු නොලැබේ.)

ix. ආබාධිත පදනමින් බඳවාගත් නිලධාරීන් ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවය කරයි නම්, නිලධාරීයාට අදාල ප්‍රියමනාප සේවා ස්ථානයේ සේවය කල හැකි උපරිම කාල සීමාව වන වසර 05 ඉක්මවා රැදී සිටීම සඳහා හෝ තමාට පහසු සේවා ස්ථානයක් ලබා ගැනීමට මෙම ප්‍රතිපාදනය අදාළ කර නොගත යුතු අතර, සේවය කළ ප්‍රියමනාප සේවා ස්ථානයට ආසන්න, ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක් ලබා දීමට ස්ථාන මාරු කමිටු කටයුතු කරනු ඇත.

x. ප්‍රියමනාප දෙපාර්තමේන්තුවල රැදී සිටීමට වෘත්තීය සංගම් සඳහා ලබාදෙන අනුග්‍රහය අදාළ කර ගත නොහැක.

2.4 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු

i. වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එක් සේවා ස්ථානයක හෝ සේවා ස්ථාන සමූහයක් තුළ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැකිය.

ii. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇතිවිට ඒ අතරින් වැඩි සේවා කාලයක් හෝ ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයෙකු (අනෙකුත් කොන්දේසි වලට යටත්ව) එම සේවා ස්ථානයට මාරු කරනු ලැබේ.

iii. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක සේවය කළ නිලධරයකු යම් සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විට එම ඉල්ලීම ඉටු කිරීමට එකී ස්ථානයේ, ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කළ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරයා ඉන් පිටතට මාරු කළ හැකිය.

iv. ප්‍රියමනාප සේවා ස්ථානයන්ට ස්ථාන මාරුවීම් ලබා දීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථානවල සේවය කළ නිලධාරින්ටය. මෙවැනි ස්ථාන මාරුවලදී සේවා කාලය හා නිලධරයන් ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ගැටළු තත්වයන්ද සළකා බලනු ලැබේ.

v. ප්‍රියමනාප ස්ථානවලට කරනු ලබන ස්ථාන මාරු ඉල්ලීමක් ඉටු කිරීමේදී, ස්ථාන මාරු වලට අනිවාර්යයෙන් යටත් වන නිලධාරීන් විසින් කරනු ලබන ඉල්ලීම් ද සළකා බලන නමුත් එහිදී ස්ථාන මාරු ඉල්ලා සිටින නිලධරයන්ගේ ඉල්ලීමට, ස්ථාන මාරු වලට අනිවාර්යයෙන් යටත් විය යුතු නිලධරයන්ගේ ඉල්ලීම්වලට වඩා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

vi. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී දෙපාර්තමේන්තුවල සේවා අවශ්‍යතාවයන්ද කාර්යාලවල කාර්ය මණ්ඩල කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට ද හැම විටම උත්සහ කළ යුතු වේ. ( උදා :- විභාග දෙපාර්තමේන්තුවට පිරිමි නිලධරයන් වැඩි ප්‍රමාණයක් රඳවා තැබීම).

vii. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවන්නේ නම්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව කටයුතු නොකරන නිලධාරීන්ගෙන් එසේ කටයුතු නොකිරීමට හේතු විමසනු ලැබේ.

viii. වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරු වීම් ලබා දීමේ ගැටළු පැන නැගී ඇත්නම් සමාලෝචන කමිටුව මගින් එම කරුණු සලකා බලා නව ස්ථාන මාරු ලබා දීමේ හැකියාව ඇති අතර එවැනි නිලධාරීන් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලැබේ.

2.4.1 සේවා කාලය ගණනය කිරිම

i. වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාල ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (උදා :- 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2025.12.31 දිනය) ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා 2026.06.30 දක්වා කාලය ගණනය කරනු ලැබේ.

ii. සේවා කාලයන් ගණනය කිරීමේ දී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබව සැලකිල්ල යොමු කරනු ලැබේ. (තවද නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.)

iii. කිසියම් දෙපාර්තමේන්තුවක්/ අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළ ද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළ ද දිස්ත්‍රික් සේවා කාලය ගණන් ගැනේ.

iv. ඇමුණුම 01 හි දක්වා ඇති සේවා ස්ථාන හෝ සේවා කිහිපයක සේවය කර ඇති නිලධරයෙකු කුමන සේවා ස්ථානයක සේවය කළද වසර 05කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් ස්ථාන මාරුවීම් වලට යටත් වේ. එහෙත් ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරනු ලබන නිලධරයෙකු හට එම සේවා ස්ථානයේ වසර 05ක කාලයක් සේවය කිරීමට අවස්ථාව හිමිවේ.

v. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ස්ථාපිතවීම හෝ අහෝසිවීම හේතුවෙන් එක් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක සිට වෙනත් අමාත්‍යාංශයකට/ දෙපාර්තමේන්තුවකට අනුයුක්ත කිරීමට සිදුවූ නිලධරයන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේදී අහෝසි කරන ලද අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ සේවා කාලය ද, විනය හේතු හෝ දඬුවම් මාරුවක් ලෙස ස්ථාන මාරු ලද නිලධාරින් හැර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු ලද නිලධාරීන්ගේ සේවා කාලය ගණනය කිරීමේදී ඔවුන් අවසන් වරට සේවය කළ සේවා ස්ථානයේ සේවය කළ සේවා කාලයද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවම සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

vi. දිස්ත්‍රික්ක 02ක් තුළ ඇමුණුම 02හි සඳහන් ආසන්නයේ ඇති නාගරික කාර්යාලයන් අතර දිස්ත්‍රික්ක පදනමින් බැහැරව ස්ථාන මාරු කිරීමට සළකා බලනු ලැබේ. (උදා: පානදුර හා මොරටුව නාගරික කාර්යාල අතර)

vii. සංවර්ධන නිලධාරින් සඳහා, එක් වසරක පුහුණුව ආරම්භ කල දිනය නොව නියමිත පුහුණුව අවසන් කිරීමෙන් පසු සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට පත්වීම් ලබා දුන් දිනය ඔවුන්ගේ පත්වීම් දිනය ලෙස සළකා ස්ථාන මාරු අයදුම්පත් සකස් කළ යුතුය.

2.4.2 ප්‍රියමනාප සේවා ස්ථානවල සේවා කාලය ගණනය කිරීම -

i. ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකුට නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට මාරුවීමට ඉල්ලුම් කළ හැක්කේ ප්‍රියමනාප සේවා ස්ථානයෙන් පිටතට ගොස් වසර 15ක් ගතවී ඇතිනම් පමණි.

ii. සේවාවන් එකකට වඩා වැඩි ගණනක සේවය කළ නිලධරයන්ගේ ප්‍රියමනාප සේවා කාලය ගණන් ගැනීමේදී පෙර සේවයක දී එම සේවයට ප්‍රියමනාප වූ දෙපාර්තමේන්තුවක සේවය කර ඇත්නම් එම සේවා කාලයද ගණන් ගනු ලැබේ. (උදා :- කණිෂ්ඨ සේවක උසස්වීම් ලද නිලධරයන්ගේ කණිෂ්ඨ සේවක සේවා කාලය)

iii. ප්‍රියමනාප යැයි සැළකෙන සේවා ස්ථානයක දැනට සේවය කරන නිලධාරිනියකගේ සේවා කාලය ගණනය කිරීමේදී, ඇය එම සේවා ස්ථානයේ සේවය කළ කාලය තුළදී ලබා ගෙන ඇති ප්‍රසූත නිවාඩු ප්‍රමාණයට අනුරූපව සේවා කාලය දීර්ඝ කළ යුතුය. නමුත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු ලබා ඇත්තේ නම් එම කාලය සඳහා ප්‍රියමනාප සේවා ස්ථානය තුල සේවා කාලය දීර්ඝ කිරීමක් නොකළ යුතුය.

උදා: 2021.01.01 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සේවයට පැමිණි නිලධාරිනියක් 2022 වර්ෂයේ මාස 06 ක් ප්‍රසූත නිවාඩු ලබා ගෙන ඇති විට අදාළ නිලධාරිනියගේ සේවා කාලය 2026.01.01 දින සිට මාස 06 කින් දීර්ඝ විය යුතුය.නිලධාරිනිය වැටුප් රහිත ප්‍රසූත නිවාඩු ලබාගෙන ඇත්නම් එම කාලය සේවා දීර්ඝ කිරීමට අදාල නොවේ.

iv. ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවයේ නියුතු නිලධාරිනියන් එම සේවා කාලය තුළ ප්‍රසූත නිවාඩු ලබා තිබේ නම් ඒ බව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය සඳහා අයදුම්පත් කැඳවීමේදී අනිවාර්යෙන්ම සඳහන් කළ යුතු වේ. ඒ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

2.4.3 වාර්ෂික ස්ථාන මාරු කමිටු විසින් කටයුතු නොකළ යුතු අවස්ථා

පහත නම් දැක්වෙන ආයතනවලට වාර්ෂික ස්ථාන මාරු කමිටු මගින් ස්ථාන මාරු වීම් නොකළ යුතුය.

i. ජනාධිපති ලේකම් කාර්යාලය
ii. අග්‍රාමාත්‍ය කාර්යාලය
iii. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය
iv. සභානායක ලේකම් කාර්යාලය
v. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
vi. විපක්ෂ නායක ලේකම් කාර්යාලය
vii. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභා කාර්යාලයේ, සේවා කාලය වසර 05ට වැඩි නිලධරයන් ස්ථාන මාරු කිරීමේදී යම් නිලධාරියෙකු තවදුරටත් රඳවාගැනීමට එම ආයතන ප්‍රධානීන් විසින් කරනු ලබන නිර්දේශය සළකා බැලීමට වාර්ෂික ස්ථාන මාරු කමිටු කටයුතු කළ යුතුය.
viii. පහත දැක්වෙන දෙපාර්තමේන්තු සහ ආයතනවලට වාර්ෂික ස්ථාන මාරු කමිටු මගින් මාරු වීම් කළ හැකි නමුත් එම දෙපාර්තමේන්තු / ආයතනවලට යොමු කරන ලබන නිලධරයන් පිළිබඳව අදාළ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියාගේ එකඟතාවයට යටත්ව මාරු වීම් ක්‍රියාත්මක කළ යුතුය.

a. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
b. පොලිස් කොමිෂන් සභාව

c. මැතිවරණ කොමිෂන් සභාව

3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

අංක 2310/29 හා 2022.12.14 දිනැති ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 250 සංශෝධනයට අනුව ඒකාබද්ධ සේවා අංශයේ වාර්ෂික ස්ථාන මාරු කමිටුවක සංයුතිය පහත පරිදි වේ.

i. ඒකාබද්ධ සේවා අංශයේ සේවාවට අදාළ විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරයෙක්
ii. ඒකාබද්ධ සේවා අංශයේ වෙනත් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරයෙක්
iii. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තිය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්

4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචනය කිරීම සඳහා එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටු වීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරනු ලැබේ. එම එක් එක් සමාලෝචන කමිටු වල සංයුතිය පහත පරිදි වේ.

i. ඒකාබද්ධ සේවා අංශයේ සේවාවට අදාළ විෂය භාර අධ්‍යක්ෂවරයෙක්
ii. ඒකාබද්ධ සේවා අංශයේ සේවාවට අදාළ විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරයෙක්
iii. ඒකාබද්ධ සේවා අංශයේ වෙනත් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරයෙක්
iv. එක් එක් සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තිය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්

5. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැළකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

5:1 විශේෂිත කරුණු

i. යම් නිලධරයෙකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී අබාධිත තත්වයකට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. මෙවැනි නිලධාරීන් සඳහාද ප්‍රියමනාප සේවා ස්ථාන ලබා දිය හැක්කේ සේවා කාලය පදනම්ව පමණකි. (වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කරනු නොලැබූ ඉල්ලීම් සම්බන්ධයෙන් පසුව සළකා බලනු නොලැබේ.) මෙවැනි නිලධාරීන් ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කරන්නේ නම් වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.3.2.vii වගන්තිය ඔවුන්ට අදාළ වේ.

ii. සෑම විටම නිලධාරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සහයක්ම දැරිය යුතු අතර ප්‍රියමනාප නොවන්නාවූ කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධාරයන් තෝරා ගැනීමේදී පාසැල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන් ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දේ.

iii. පාසල් යන දරුවන්, අබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සළකා බලනු ලැබේ.

iv. අබාධිත, පුනරුත්ථාපන කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරින් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරුවීම් කරනු නොලැබේ.මෙවැනි නිලධාරීන් ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කරන්නේ නම් වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.3.2.viii වගන්තිය ඔවුන්ට අදාළ වේ.

v. ඒකාබද්ධ රියදුරු සේවයේ නියුතු නිල රථ රියදුරන් සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් වාර්ෂික ස්ථාන මාරු කමිටු රැස්වීමට පෙර ඒකාබද්ධ සේවා අංශයට දැනුම් දී තිබිය යුතු අතර පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

5.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්

i. අවුරුදු 53 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

ii. වාර්ෂික ස්ථාන මාරු සඳහා කාල ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට (උදා: 2026 වර්ෂය සඳහා 2025.12.31 දිනට) අවු:58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුවද මාරු නොකළ යුතුය. ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කරන දෙසැම්බර් 31 වන දිනට වයස අවුරුදු 59 ඉක්මවූ නිලධරයන්ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරු නොකළ යුතුය. (නමුත් ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කරන නිලධාරීන්, ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කළ හැකි වසර 5 ඉක්මවීම මත පිටතට ස්ථාන මාරු කරන විටදී මෙම පදනමින් තම ස්ථිර වාසස්ථානය පිහිටි දිස්ත්‍රික්කයට අදාළ සේවා ස්ථාන ඉල්ලුම් කළද ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හැකියාවක් නොමැත)

5.3 වෘත්තිය සංගම් සඳහා අනුග්‍රහය

i. කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිගත් ඒකාබද්ධ සේවයේ සේවයකට අයත් වෘත්තිය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තිය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය. මේ සඳහා අදාළ වෘත්තිය සමිතිය ස්ථාන මාරු කමිටුව අයත් වන ඒකාබද්ධ සේවයේ එකම සේවාවට අදාළ විය යුතුය.දෙපාර්තමේන්තු හෝ ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවාගත් වෘත්තිය සංගම් සඳහා මෙම අනුග්‍රහය වලංගු නොවේ.

ii. මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳීමට අපේක්ෂා කරන ඒකාබද්ධ සේවයේ වෘත්තිය සංගම්වල නිලධරයන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙල කර (ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයෙහි 7:5 උපවගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයෙහි 7.2 උප වගන්තිය අනුව අනුග්‍රහය ලබා දිය යුතු වන්නේ, කවර නිලතල වලටද යන වගත්, කුමන සංගමයකට ද යන වගත්, අනුයුක්ත කළ යුතු වන්නේ කවර ස්ථානවලටද යන වගත්, රාජ්‍ය පරිපාලන ලේකම් විසින් තීරණය කරනු ලැබේ. වෘත්තිය සංගම් සඳහා ලබා දෙන අනුග්‍රහය සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

06. ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කාල සටහන

| | |
|---|---|
| ජූනි 16 ට පෙර | මාරු කමිටු පිහිටුවීම |
| ජූලි 15 ට පෙර | ස්ථාන මාරු පටිපාටිය සකස් කර ගැනීම |
| ජූලි 31 ට පෙර | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම |
| අගෝස්තු 22 ට පෙර | පහත සඳහන් ලේඛන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම.<br>(i) LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://10.250.1.112/misco වෙබ් ලිපිනයෙන්ද වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://43.224.125.68/misco ඔස්සේද මාර්ගගත ක්‍රමයට අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ආයතන ප්‍රධානියා විසින් මාර්ගගතව නිර්දේශ කරන ලද මාර්ගගත වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත.<br>(ii) මාර්ගගත මෘදුකාංගය ඔස්සේ ලබා ගන්නා ලද 2025.12.31 දිනට ආයතනයක/සේවා ස්ථාන සමූහය තුළ පවත්නා කාර්යාලයක හෝ කාර්යාලවල/දිස්ත්‍රික්කයක වසර 05 ට වඩා සේවය කළ නිලධරයන්ගේ හා ස්ථාන මාරු අයදුම් කළ නිලධාරීන්ගේ |

| | |
|---|---|
| | නාමලේඛනයක්. |
| සැප්තැම්බර් 15 ට පෙර | ඒකාබද්ධ සේවා අංශයේ මාරු කමිටු රැස්වී ස්ථාන මාරු තීරණ ගැනීම අවසන් කිරීම |
| ඔක්තෝබර් 01 ට පෙර | ස්ථාන මාරු තීරණ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට දැන්වීම සහ වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම |
| ඔක්තෝබර් 15 ට පෙර | ස්ථානමාරු වීම් පිළිබඳව ඒකාබද්ධ සේවා අංශය වෙත සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය |
| ඔක්තෝබර් 31 ට පෙර | එම අභියාචනා පිළිබඳ සමාලෝචන කමිටු මගින් තීරණ ගැනීම |
| නොවැම්බර් 17 ට පෙර | සමාලෝචන කමිටු තීරණ දැනුම් දීම අවසන් කිරීම |
| දෙසැම්බර් 01 ට පෙර | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අවසන් දිනය |
| ජනවාරි 01 | වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම |

7. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය මාර්ගගත ක්‍රමය ඔස්සේ LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://10.250.1.112:7009 වෙබ් ලිපිනයෙන්ද වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://43.224.125.68:7009 මගින්ද අයදුම් කළ හැක. අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ කරන ලදුව හා නිල මුද්‍රාව සහිතව අත්සන් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා අයදුම්පතෙහි මුද්‍රිත පිටපත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත **2025.12.01** දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාල ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, නිලධරයා ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධාරියෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු භාර දෙනු ලබන අභියාචනය අදාල සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදියද, ඊට අදාළ තම නිරීක්ෂණද, නිර්දේශයද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වග බලා ගත යුතු වන්නේය. එතකඳු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ 2025.12.01 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධාරියෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සළකා බලනු නොබලන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, අදාළ ලිපිගොනු යථාවත් කර ගැනීම සඳහා එහි පිටපත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේ වුව ද ඒ සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ අවසන් තීරණය ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි

එන්.යූ. නිශාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දිනය : 2025.07.21

නිල මුද්‍රාව:
නිශාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

**පහත කාර්යාලයන්ට අමතරව අදාළ වපසරිය තුළ හඳුනා ගන්නා අනෙකුත් කාර්යාලද මෙම කාර්යාල සමූහය සඳහා ඇතුළත් වේ.**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් කාර්යාලය
ii. මිනින්දෝරු දෙපාර්තමේන්තුව
iii. විගණන උප කාර්යාලය, ගම්පහ
iv. ඉඩම් පරිහරණ දිස්ත්‍රික් කාර්යාලය
v. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
vi. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය
vii. සංඛ්‍යාලේඛන දිස්ත්‍රික් කාර්යාලය
viii. දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
ix. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ගම්පහ
x. නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලය
xi. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
xii. දිසාවන කාර්යාලය
xiii. සහකාර සමුපකාර කොමසාරිස් කාර්යාලය
xiv. අඩවි වන කාර්යාලය
xv. අපනයන කෘෂිකර්ම  දෙපාර්තමේන්තුව
xvi. ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**කාර්යාල සමූහ II**

i. මීගමුව කම්කරු විනිශ්චය සභාව
ii. මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
iii. මීගමුව කම්කරු කාර්යාලය
iv. මීගමුව ධීවර හා ජලජ සම්පත් ප්‍රාදේශීය කාර්යාලය
v. මීගමුව පොලිස් අධිකාරී කාර්යාලය
vi. සීදූව සමාජ සේවා දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලය
vii. මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
viii. මීගමුව ගුරු විදුහල
ix. මීගමුව ජාතික පාසල
x. මීගමුව සමෘද්ධි කාර්යාලය

**කළුතර දිස්ත්‍රික්කය**
**කාර්යාල සමූහ I**

i. කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ii. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
iii. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය
iv. දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
v. මැතිවරණ කාර්යාලය
vi. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
vii. ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය
viii. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ix. කුඩා ව්‍යාපාර කාර්යාලය
x. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
xi. ධීවර දෙපාර්තමේන්තුව
xii. තක්සේරු දෙපාර්තමේන්තුව
xiii. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
xiv. කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**කාර්යාල සමූහ II**

i. හොරණ රාජකීය විද්‍යාලය
ii. හොරණ ශ්‍රීපාලි විද්‍යාලය
iii. හොරණ තක්ෂිලා විද්‍යාලය
iv. හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
v. සහකාර පොලිස් අධිකාරී කාර්යාලය, හොරණ
vi. ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, හොරණ

**මහනුවර දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
ii. කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව
iii. කුඩා ව්‍යාපාර සංවර්ධන කාර්යාලය
iv. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
v. ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය
vi. එලදායිතා ලේකම් කාර්යාලය
vii. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
viii. මානව සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
x. සමෘද්ධි දෙපාර්තමේන්තුව
xi. සමාජ ආරක්ෂණ දෙපාර්තමේන්තුව
xii. සමාජ සේවා දෙපාර්තමේන්තුව
xiii. දිස්ත්‍රික් සැලසුම් කාර්යාලය
xiv. ළමා හා කාන්තා කටයුතු කාර්යාලය
xv. පුපුරන ද්‍රව්‍ය පාලන කාර්යාලය
xvi. මැතිවරණ කාර්යාලය
xvii. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලය
xviii. ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
xix. කම්කරු දෙපාර්තමේන්තුව
xx. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව (කලාප)
xxi. පුෂ්පදාන බාලිකා විද්‍යාලය, මහනුවර
xxii. නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
xxiii. පොලිස් අධිකාරී කාර්යාලය
xxiv. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
xxv. තැපැල් දෙපාර්තමේන්තුව, මහනුවර
xxvi. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xxvii. ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
xxviii. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
xxix. මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**කාර්යාල සමූහ II**

i. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - පේරාදෙණිය
ii. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - පේරාදෙණිය
iii. උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව - පේරාදෙණිය
iv. පළාත් මිනින්දෝරු දෙපාර්තමේන්තුව - පේරාදෙණිය
v. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - පේරාදෙණිය

**මාතලේ දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
ii. මැතිවරණ කොමසාරිස් කාර්යාලය
iii. මාතලේ දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාලය
iv. මිනින්දෝරු කාර්යාලය
v. සමූපකාර දෙපාර්තමේන්තුව
vi. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
vii. මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
viii. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
ix. මිනින්දෝරු ප්‍රාදේශීය කාර්යාලය
x. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
xi. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
xii. සංඝමිත්තා බාලිකා විද්‍යාලය
xiii. ක්‍රිස්තුදේව ජාතික පාසල
xiv. විජය ජාතික පාසල
xv. සහිරා විද්‍යාලය
xvi. පාක්‍යම් විද්‍යාලය
xvii. හින්දු විද්‍යාලය
xviii. කම්කරු කාර්යාලය
xix. මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ii. කම්කරු දෙපාර්තමේන්තුව
iii. රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය
iv. ඉඩම් පරිහරණ ජනරාල් දෙපාර්තමේන්තුව
v. දිවිනැගුම දෙපාර්තමේන්තුව
vi. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
vii. සැලසුම් ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
viii. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ix. නුවරඑළිය ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
x. නුවරඑළිය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xi. නුවරඑළිය පොලිස් දෙපාර්තමේන්තුව
xii. නුවරඑළිය කෘෂි රක්ෂණ මණ්ඩල කාර්යාලය
xiii. නුවරඑළිය තැපැල් අධිකාරී කාර්යාලය
xiv. නුවරඑළිය දිසාවන නිලධාරී කාර්යාලය
xv. නුවරඑළිය කාර්මික සංවර්ධන මණ්ඩල කාර්යාලය
xvi. නුවරඑළිය මිනින්දෝරු කාරියාලය
xvii. නුවරඑළිය දිස්ත්රික් මැතිවරණ කාර්යාලය
xviii. නුවරඑළිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය
xix. නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණය

**ගාල්ල දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. මැතිවරණ කාර්යාලය
ii. ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
iii. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය
iv. දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලය
v. සහකාර විගණකාධිපති කාර්යාලය
vi. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
vii. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - දිසා කලාප කාර්යාලය
viii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය
ix. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
x. ගාල්ල බන්ධනාගාර දෙපාර්තමේන්තුව
xi. ගාල්ල කාර්මික විද්‍යාලය
xii. ඇලවීෂියස් විද්‍යාලය
xiii. විද්‍යාලෝක විද්‍යාලය
xiv. කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
xv. කම්කරු දෙපාර්තමේන්තුව
xvi. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය
xvii. පළාත් මැනුම්පති කාර්යාලය
xviii. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
xix. සවුත්ලන්ඩ්ස් විද්‍යාලය
xx. දිසාවන කාර්යාලය
xxi. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xxii. තැපැල් දෙපාර්තමේන්තුව
xxiii. නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
xxiv. ගාල්ල අධිකරණ සංකීර්ණය
xxv. ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>කාර්යාල සමූහ II</u>**

i. බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ලබුදූව
ii. කෘෂිකර්ම කාර්යාලය, ලබුදූව - අක්මීමන
iii. ගොවිජන සේවා කොමසාරිස් කාර්යාලය, ලබුදූව - අක්මීමන
iv. රුහුණු ජාතික අධ්‍යාපන පීඨය, කුරුඳුවත්ත - අක්මීමන
v. වී පර්යේෂණ මධ්‍යස්ථානය, ලබුදූව - අක්මීමන
vi. සංස්කෘතික මධ්‍යස්ථානය, ගොඩකන්ද - ගාල්ල
vii. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ලබුදූව - අක්මීමන

**<u>මාතර දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
ii. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
iii. ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
iv. මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
v. ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාලය, මාතර
vi. තක්සේරු දෙපාර්තමේන්තුව
vii. ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
viii. සාන්ත සර්වේසස් විද්‍යාලය
ix. කලාප අධ්‍යාපන කාර්යාලය, පල්ලිමුල්ල
x. වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
xi. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
xii. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, ගබඩාවීදිය
xiii. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
xiv. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය, මාතර

xv. සාන්ත තෝමස් කුමර විද්‍යාලය, මාතර
xvi. සාන්ත තෝමස් උසස් බාලිකා විද්‍යාලය, මාතර
xvii. මාතර මහා විද්‍යාලය
xviii. මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

<u>**හම්බන්තොට දිස්ත්‍රික්කය**</u>

<u>**කාර්යාල සමූහ I**</u>

i. හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ii. මැතිවරණ දෙපාර්තමේන්තුව
iii. තැපැල් කාර්යාලය (උප කාර්යාලය)
iv. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
v. කම්කරු දෙපාර්තමේන්තුව
vi. දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය
vii. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
viii. තක්සේරු කාර්යාලය
ix. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
x. කෘෂිකර්ම කාර්යාලය
xi. හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

<u>**කාර්යාල සමූහ II**</u>

i. තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
ii. තංගල්ල ධීවර හා ජලජ සම්පත් කාර්යාලය
iii. තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
iv. තංගල්ල අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය
v. තංගල්ල පොලිස් අධිකාරී කාර්යාලය
vi. තංගල්ල නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
vii. තංගල්ල බාලිකා විද්‍යාලය
viii. තංගල්ල පිරිමි ජාතික පාසැල

<u>**යාපනය දිස්ත්‍රික්කය**</u>

<u>**කාර්යාල සමූහ I**</u>

i. දිස්ත්‍රික් සැලසුම් කාර්යාලය
ii. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
iii. මැතිවරණ කාර්යාලය
iv. කෘෂිකර්ම දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
v. විදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රාදේශීය කාර්යාලය
vi. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය
vii. ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය
viii. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ix. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
x. මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
xi. නැවත පදිංචි කිරීමේ ඒකකය
xii. විගණකාධිපති කාර්යාලය
xiii. යාපනය තක්සේරු දෙපාර්තමේන්තුව
xiv. යාපනය දිස්ත්‍රික් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
xv. යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
xvi. මිනින්දෝරු දෙපාර්තමේන්තුව
xvii. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
xviii. යාපනය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

xix. යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>මන්නාරම දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ii. කම්කරු දෙපාර්තමේන්තුව
iii. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
iv. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
v. මැතිවරණ දෙපාර්තමේන්තුව
vi. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
vii. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව
viii. ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
ix. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
x. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
xi. විගණන අධිකාරී කාර්යාලය
xii. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
xiii. පොලිස් දෙපාර්තමේන්තුව
xiv. මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>වවුනියාව දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
ii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බීජ)
iii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (පර්යේෂණ)
iv. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
v. වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
vi. වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
vii. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. කම්කරු  දෙපාර්තමේන්තුව
ix. මිනින්දෝරු දෙපාර්තමේන්තුව
x. කාර්මික විද්‍යාලය
xi. උසස් තාක්ෂණ විද්‍යාලය
xii. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
xiii. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
xx. ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව
xiv. කුඩා ව්‍යාපාර දෙපාර්තමේන්තුව
xv. අඩවි වන කාර්යාලය
xvi. විද්‍යා පීඨය
xvii. වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>මුලතිව් දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ii. මැතිවරණ දෙපාර්තමේන්තුව

iii. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
iv. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
v. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
vi. මැරිටයිම්පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
vii. මිනින්දෝරු දෙපාර්තමේන්තුව
viii. මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>කිලිනොච්චි දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
ii. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
iii. කාන්තා හා ළමා කටයුතු ඒකකය
iv. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය
v. දිස්ත්‍රික් දිවිනැගුම කාර්යාලය
vi. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
vii. දිස්ත්‍රික් වන සංරක්ෂණ කාර්යාලය
viii. කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ix. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
x. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය
xi. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු (පලාත් කාර්යාලය)
xii. කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>මඩකලපුව දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ii. ඉඩම් පරිහරණ පතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තු කාර්යාලය
iii. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
iv. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
v. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
vi. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
vii. මාධ්‍ය දෙපාර්තමේන්තුව
viii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ix. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
x. මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
xi. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
xii. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය
xiii. දිස්ත්‍රික් වන සංරක්ෂණ කාර්යාලය
xiv. තක්සේරු දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
xv. විගණකාධිපති දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
xvi. මිනින්දෝරු දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
xvii. කම්කරු දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
xviii. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය
xix. පොලිස් දෙපාර්තමේන්තුව
xx. මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**අම්පාර දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
ii. දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලය
iii. ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව
iv. දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
v. ජන හා සංඛ්‍යාලේඛන කාර්යාලය
vi. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලය
vii. සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය
viii. විගණන කාර්යාලය
ix. කුඩා ව්‍යාපාර සංවර්ධන දෙපාර්තමේන්තුව
x. දිස්ත්‍රික් පොහොර ලේකම් කාර්යාලය
xi. බීජ සහතික කිරීමේ කාර්යාලය
xii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය
xiii. අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
xiv. සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලය
xv. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය
xvi. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
xvii. වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
xviii. වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය
xix. ඩී.එස්. සේනානායක ජාතික පාසල
xx. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (අන්තර් පලාත්)
xxi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
xxii. අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. ත්‍රිකුණාමලය නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
ii. ත්‍රිකුණාමලය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
iii. ත්‍රිකුණාමලය සමෘද්ධි කාර්යාලය
iv. ත්‍රිකුණාමලය ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය
v. ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්යාලය
vi. ත්‍රී/ විපුලානන්දා විදුහල
vii. දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලය
viii. දිස්ත්‍රික් මිල පාලන කාර්යාලය
ix. පුපුරණ ද්‍රව්‍ය පාලක කාර්යාලය
x. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**කාර්යාල සමූහ II**

i. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නගර හා කඩවත් ත්‍රිකුණාමලය
ii. සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය
iii. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය
iv. රජයේ විගණන කාර්යාලය
v. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය
vi. දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
vii. සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලය
viii. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය
ix. නියෝජ්‍ය මැනුම්පති කාර්යාලය
x. ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාලය

xi. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී කාර්යාලය
xii. පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලය
xiii. දිසාවන නිලධාරී කාර්යාලය
xiv. ශ්‍රී ලංකා නාවික හමුදා කාර්යාලය
xv. වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය
xvi. ත්‍රි/ කෝනේෂ්වරා හින්දු විදුහල
xvii. ත්‍රි/ ශ්‍රි ෂන්මුගා හින්දු බාලිකා විද්‍යාලය
xviii. ත්‍රි/ රාජකීය විද්‍යාලෝක විදුහල
xix. ත්‍රි/ ශාන්ත මරියා විදුහල
xx. ත්‍රි/ සිංහල මධ්‍ය මහා විද්‍යාලය
xxi. ත්‍රි/ ෂාන්ත ජෝෂප් විදුහල
xxii. ත්‍රි/ ඕර්ස් හීල් විවේකානන්දා විදුහල
xxiii. ත්‍රි/ සාහිරා විදුහල
xxiv. ත්‍රි/ මැදඩිස් බාලිකා විදුහල

**කාර්යාල සමූහ III**

i. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කින්නියා
ii. ත්‍රි/කින්නියා මධ්‍ය මහා විද්‍යාලය
iii. ත්‍රි/කින්නියා අල් අක්ෂා විදුහල
iv. ත්‍රි/කින්නියා අල් හිරා විදුහල
v. ත්‍රි/කින්නියා මුස්ලිම් බාලිකා විදුහල

**කාර්යාල සමූහ Iv**

i. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කන්තලේ
ii. නියෝජ්‍ය පොලිස් අධිකාරී කාර්යාලය, කන්තලේ
iii. සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලය, කන්තලේ
iv. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය, කන්තලේ
v. ත්‍රි/කන්තලේ මධ්‍ය මහා විද්‍යාලය
vi. ත්‍රි/කන්තලේ අග්‍රබෝධි මහා විද්‍යාලය

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
ii. දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාලය
iii. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
iv. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
v. රෙජිස්ට්‍රාර් ජනරාල් කලාප කාර්යාලය
vi. දිසාවන කාර්යාලය
vii. දිස්ත්‍රික් විදේශ ගමන් බලපත් කාර්යාලය
viii. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ප්‍රාදේශීය කාර්යාලය
ix. වයඹ සංවර්ධන, සංස්කෘතික හා අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශ කලාප කාර්යාලය
x. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
xi. ගොවිජන සේවා කාර්යාලය
xii. කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
xiii. මලියදේව විද්‍යාලය
xiv. මලියදේව බාලිකා විද්‍යාලය

**කාර්යාල සමූහ II**

i. පොලිස් අධිකාරී කාර්යාලය, කුලියාපිටිය
ii. කුලියාපිටිය කම්කරු කාර්යාලය
iii. කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

iv. කුලියාපිටිය කම්කරු විනිශ්චය සභාව
v. කුලියාපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
vi. සමෘද්ධි කාර්යාලය, කුලියාපිටිය
vii. කුලියාපිටිය කාර්මික විද්‍යාලය
viii. කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය

**<u>පුත්තලම දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය
ii. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
iii. දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
iv. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කාර්යාලය
v. විගණන අධිකාරී කාර්යාලය
vi. පොලිස් අධිකාරී කාර්යාලය
vii. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය
viii. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය
ix. දිසා වන නිලධාරී කාර්යාලය
x. පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
xi. වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
xii. නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
xiii. කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තු පුත්තලම කාර්යාලය
xiv. ධීවර කාර්යාලය
xv. වනජීවී සංරක්ෂණ කාර්යාලය
xvi. කම්කරු කාර්යාලය
xvii. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කාර්යාලය
xviii. පුරාවිද්‍යා කාර්යාලය
xix. වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය
xx. පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>අනුරාධපුර දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. ක්‍රමසම්පාදන කාර්යාලය
ii. ජන හා සංඛ්‍යාලේඛන කාර්යාලය
iii. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
iv. මැතිවරණ කාර්යාලය
v. ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව
vi. ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
vii. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
viii. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
xi. නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
xii. දිස්ත්‍රික් මිනින්දෝරු දෙපාර්තමේන්තුව
xiii. පලාත් මිනින්දෝරු දෙපාර්තමේන්තුව
xiv. කම්කරු දෙපාර්තමේන්තුව
xv. තැපැල් අධිකාරී කාර්යාලය
xvi. තක්සේරු දෙපාර්තමේන්තුව
xvii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය
xviii. තාක්ෂණ විද්‍යාලය
xix. අ/ මධ්‍ය මහා විද්‍යාලය

xx. අ/ ස්වර්ණපාලි බාලිකා විද්‍යාලය
xxi. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xxii. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
xxiii. අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>පොලොන්නරුව දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලය
ii. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය
iii. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
iv. ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය
v. කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය
vi. ආපදා කළමනාකරණ ඒකකය
vii. තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
viii. දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය
ix. දිස්ත්‍රික් වන සංරක්ෂණ කාර්යාලය
x. වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය
xi. පොලිස් අධිකාරී කාර්යාලය
xii. පො/ රාජකීය විද්‍යාලය
xiii. වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
xiv. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
xv. පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
xvi. පොලොන්නරුව කම්කරු කාර්යාලය

**<u>බදුල්ල දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බදුල්ල
ii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය
iii. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය
iv. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
v. දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලය
vi. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කාර්යාලය
vii. කුඩා ව්‍යාපාර සංවර්ධන කාර්යාලය
viii. ජාතික සහජීවනය හා රාජ්‍ය භාෂා කාර්යාලය
ix. දිස්ත්‍රික් මිල පාලන කාර්යාලය
x. සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය
xi. දිස්ත්‍රික් තක්සේරු කාර්යාලය
xii. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය
xiii. පුපුරණ ද්‍රව්‍ය පාලක කාර්යාලය
xiv. බදුල්ල දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ කාර්යාලය
xv. රජයේ විගණන කාර්යාලය
xvi. නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
xvii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය
xviii. දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
xix. සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලය
xx. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය
xxi. නියෝජ්‍ය මැනුම්පති කාර්යාලය
xxii. නියෝජ්‍ය පෝස්ට් මාස්ටර් ජනරාල් කාර්යාලය

xxiii. ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාලය
xxiv. අපනයන කෘෂිකර්ම කාර්යාලය
xxv. අංක 05 කම්කරු විනිශ්චය සභාව, බදුල්ල
xxvi. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී කාර්යාලය
xxvii. පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලය
xxviii. ධර්මදූත විද්‍යාලය, බදුල්ල
xxix. බදුල්ල මධ්‍ය මහා විද්‍යාලය
xxx. විශාඛා උසස් බාලිකා විද්‍යාලය, බදුල්ල
xxxi. සරස්වතී විද්‍යාලය, බදුල්ල
xxxii. තාක්ෂණ විද්‍යාලය, බදුල්ල
xxxiii. ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානය, ඌව
xxxiv. බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**කාර්යාල සමූහ II**

i. බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ii. මිනින්දෝරු අධිකාරී කාර්යාලය, බණ්ඩාරවෙල
iii. කහගොල්ල කෘෂිකර්ම පර්යේක්ෂණ ආයතනය
iv. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, බණ්ඩාරවෙල
v. පොලිස් අධිකාරී කාර්යාලය, බණ්ඩාරවෙල
vi. ඌව විද්‍යා පීඨය
vii. බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය
viii. ශාන්ත ජෝශප් විද්‍යාලය
ix. විශාකා බාලිකා විද්‍යාලය, බණ්ඩාරවෙල
x. කුඩා කුසුම් බාලිකා විද්‍යාලය, බණ්ඩාරවෙල
xi. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය, බණ්ඩාරවෙල
xii. කම්කරු විනිශ්චය සභාව, බණ්ඩාරවෙල
xiii. කාර්මික විද්‍යාලය, වැවතැන්න

**කාර්යාල සමූහ IIL**

i. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය දියතලාව
ii. කහගොල්ල ජාතික පාසල
iii. හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දියතලාව
iv. දියතලාව ගුවන් හමුදාව

**කාර්යාල සමූහ Iv**

i. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය මහියංගනය
ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මහියංගනය
iii. මහියංගනය ජාතික පාසල
iv. ප්‍රාදේශීය කම්කරු කාර්යාලය, මහියංගනය

**මොණරාගල දිස්ත්‍රික්කය**

**කාර්යාල සමූහ I**

i. දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාලය
**ii.** දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය
iii. ජන හා සංඛ්‍යාලේඛන කාර්යාලය
iv. ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය

v. සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය
vi. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
vii. සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය
viii. රජයේ විගණන උප කාර්යාලය
ix. වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය
x. දිසාවන කාර්යාලය
xi. අන්තර් පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය
xii. පොදු වැඩ ඉංජිනේරු කාර්යාලය
xiii. විගණකාධිපති දෙපාර්තමේන්තුව
xiv. ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය
xv. දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
xvi. රබර් සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය
xvii. අපනයන කෘෂිකර්ම කාර්යාලය
xviii. මිනින්දෝරු අධිකාරී කාර්යාලය
xix. මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
xx. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
xxi. වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
xxii. දිසා මහේස්ත්‍රාත් අධිකරණය
xxiii. පලාත්බද මහාධිකරණය
xxiv. පොලිස් අධිකාරී කාර්යාලය
xxv. මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>**

**<u>කාර්යාල සමූහ I</u>**

i. රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය
ii. ඌව සබරගමුව  රෙජිස්ට්‍රාර් කලාප කාර්යාලය
iii. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලය
iv. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
v. විගණන අධිකාරී කාර්යාලය
vi. ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය
vii. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය
viii. මැතිවරණ කාර්යාලය
ix. රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
x. මිනින්දෝරු කාර්යාලය
xi. නියෝජ්‍ය සර්වේයර් ජනරාල් කාර්යාලය
xii. පලාත් සර්වේයර් ජනරාල් කාර්යාලය
xiii. තක්සේරු දෙපාර්තමේන්තුව
xiv. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කාර්යාලය
xv. දිසා වන නිලධාරී කාර්යාලය
xvi. නියෝජ්‍ය ගොවිජන සේවා කාර්යාලය
xvii. කම්කරු විනිශ්චය සභාව
xviii. කාර්මික විද්‍යාලය
xix. උසස් තාක්ෂණ විද්‍යාලය
xx. සීවලී මධ්‍ය මහා විද්‍යාලය
xxi. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
xxii. මහාධිකරණය/ දිසා අධිකරණය
xxiii. සිවිල් අභියාචනා මහාධිකරණය
xxiv. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxv. මැනුම් අධිකාරී කාර්යාලය
xxvi. වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
xxvii. රත්නපුර නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
xxviii. රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

කාර්යාල සමූහ II

i. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් අධිකාරී කාර්යාලය, මුවගම - රත්නපුර
ii. දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - රත්නපුර
iii. ෆර්ගසන් බාලිකා විද්‍යාලය - රත්නපුර
iv. ජේසු බිළින්දාගේ කන්‍යාරාමය - රත්නපුර
v. ඇලෝසියස් විද්‍යාලය - රත්නපුර
vi. සුමන බාලිකා විද්‍යාලය - රත්නපුර
vii. නියෝජ්‍ය පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලය - රත්නපුර
viii. ප්‍රාදේශීය ගිණුම් කාර්යාලය, තැපැල් අධිකාරී දෙපාර්තමේන්තුව -රත්නපුර
ix. පොලිස් අධිකාරී කාර්යාලය - රත්නපුර
x. ජාතික කෞතුකාගාරය - රත්නපුර
xi. කලාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාලය - රත්නපුර
xii. සබරගමුව කලාප කම්කරු කාර්යාලය - රත්නපුර
xiii. දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය - රත්නපුර
xiv. ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය - රත්නපුර
xv. නියෝජ්‍ය පොලිස් අධිකාරී කාර්යාලය රත්නපුර

කාර්යාල සමූහ III

i. කම්කරු කාර්යාලය - ඇඹිලිපිටිය
ii. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය, නව නගරය - ඇඹිලිපිටිය
iii. කාර්මික විද්‍යාලය - ඇඹිලිපිටිය
iv. ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

කෑගල්ල දිස්ත්‍රික්කය

කාර්යාල සමූහ I

i. කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
ii. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව , කෑගල්ල
iii. කෑගල්ල කම්කරු දෙපාර්තමේන්තුව
iv. කෑගල්ල රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
v. කෑගල්ල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
vi. කෑගල්ල දිසාවන කාර්යාලය
vii. කෑගල්ල අඩවි වන කාර්යාලය
viii. කෑගල්ල කම්කරු විනිශ්චය සභාව
ix. කෑගල්ල ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය
x. කෑගල්ල ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් කාර්යාලය
xi. කෑගල්ල පොලිස් අධිකාරී කාර්යාලය
xii. කෑගල්ල නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
xiii. කෑගල්ල දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ඒකකය
xiv. කෑගල්ල මැතිවරණ කාර්යාලය
xv. කෑගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
xvi. කෑගල්ල කාර්මික විද්‍යාලය
xvii. කෑගල්ල උසස් තාක්ෂණ ආයතනය
xviii. කෑගලු විද්‍යාලය
xix. කෑගලු බාලිකා විද්‍යාලය
xx. කෑගල්ල ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය
xxi. කෑගල්ල ශාන්ත මරියා විද්‍යාලය
xxii. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ඇමුණුම 02

**<u>දිස්ත්‍රික් දෙකකට අයත් නමුත් ආසන්නයේ පවත්නා නාගරික කාර්යාල</u>**

01. මොරටුව නගරයේ කාර්යාල, පානදුර නගරයේ කාර්යාල
02. ඉංගිරිය නගරයේ කාර්යාල, පාදුක්ක නගරයේ කාර්යාල
03. සීතාවක නගරයේ කාර්යාල, දෙහිඕවිට නගරයේ කාර්යාල
04. බණ්ඩාරගම නගරයේ කාර්යාල, කැස්බෑව නගරයේ කාර්යාල
05. මීරිගම නගරයේ කාර්යාල, අලව්ව නගරයේ කාර්යාල
06. මීගමුව නගරයේ කාර්යාල, වෙන්නප්පුව නගරයේ කාර්යාල, දංකොටුව නගරයේ කාර්යාල
07. වලල්ලාවිට නගරයේ කාර්යාල, ඇල්පිටිය නගරයේ කාර්යාල
08. බෙන්තර නගරයේ කාර්යාල, බේරුවල නගරයේ කාර්යාල, අළුත්ගම නගරයේ කාර්යාල
09. ඉංගිරිය නගරයේ කාර්යාල, කිරිඇල්ල නගරයේ කාර්යාල
10. අඹගමුව කෝරළේ නගරයේ කාර්යාල, පස්බාගෙ කෝරළේ නගරයේ කාර්යාල
11. අකුරණ නගරයේ කාර්යාල, මාතලේ නගරයේ කාර්යාල, උකුවෙල නගරයේ කාර්යාල
12. ගලගෙදර නගරයේ කාර්යාල, මාවතගම නගරයේ කාර්යාල
13. සූරියවැව නගරයේ කාර්යාල, ඇඹිලිපිටිය නගරයේ කාර්යාල
14. තංගල්ල නගරයේ කාර්යාල, දික්වැල්ල නගරයේ කාර්යාල
15. හබරාදූව නගරයේ කාර්යාල, වැලිගම නගරයේ කාර්යාල
16. වැලිපිටිය නගරයේ කාර්යාල, ඉමදූව නගරයේ කාර්යාල
17. අකුරැස්ස නගරයේ කාර්යාල, ඉමදූව නගරයේ කාර්යාල
18. හක්මන නගරයේ කාර්යාල, වලස්මුල්ල නගරයේ කාර්යාල
19. පදවිය නගරයේ කාර්යාල , පදවි ශ්‍රී පුර නගරයේ කාර්යාල, වැලිඔය නගරයේ කාර්යාල
20. දෙහිඅත්තකණ්ඩිය නගරයේ කාර්යාල, දිඹුලාගල නගරයේ කාර්යාල
21. දෙහිඅත්තකණ්ඩිය නගරයේ කාර්යාල, තමන්කඩුව නගරයේ කාර්යාල
22. ආණමඩුව නගරයේ කාර්යාල , කොටවෙහෙර නගරයේ කාර්යාල, නිකවැරටිය නගරයේ කාර්යාල
23. පන්නල නගරයේ කාර්යාල, දංකොටුව නගරයේ කාර්යාල
24. උඩුබද්දාව නගරයේ කාර්යාල, නාත්තණ්ඩිය නගරයේ කාර්යාල
25. උඩුබද්දාව නගරයේ කාර්යාල, මාදම්පේ නගරයේ කාර්යාල
26. හොරොව්පොතාන නගරයේ කාර්යාල, මොරවැව නගරයේ කාර්යාල, ගෝමරන්කඩවල නගරයේ කාර්යාල
27. ලුණුගල නගරයේ කාර්යාල, බිබිල නගරයේ කාර්යාල

28. සෙවණගල නගරයේ කාර්යාල, ඇඹිලිපිටිය නගරයේ කාර්යාල
29. කතරගම නගරයේ කාර්යාල, තිස්සමහාරාමය නගරයේ කාර්යාල
30. මහියංගණය නගරයේ කාර්යාල, මීණිපේ / හසලක නගරයේ කාර්යාල
31. මහියංගණය නගරයේ කාර්යාල, දෙහිඅත්තකණ්ඩිය නගරයේ කාර්යාල
32. මහියංගණය නගරයේ කාර්යාල, පදියතලාව නගරයේ කාර්යාල
33. වරකාපොල නගරයේ කාර්යාල, අත්තනගල්ල නගරයේ කාර්යාල
34. වරකාපොල නගරයේ කාර්යාල, අලව්ව නගරයේ කාර්යාල
35. කෑගල්ල නගරයේ කාර්යාල, පොල්ගහවෙල නගරයේ කාර්යාල

ඇමුණුම 03

දැනට පිහිටුවා ඇති බව වාර්තා වී ඇති අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු

01. මුදල් අමාත්‍යාංශය මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
02. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
03. මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
04. කම්කරු දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
05. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
06. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
07. පොලිස් දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
08. කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
09. මෝටර් රථ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
10. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු
11. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සිදුකරන අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු